
(i) අත්සන් කරනු ලබන ගිවිසුමේ යම් කොන්දේසියක් හෝ කීපයක් හෝ කඩකළහොත් ඔහුගේ පත්වීම වහාම ක්‍රියාත්මක වන පරිදි අවසන් කරනු ලැබේ.
(ii) දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් කලින් කලට පනවනු ලබන විධිවිධාන හා රෙගුලාසිවලටද යටත් වීමට එකඟවිය යුතු ය.

10. *විභාග ගාස්තු :*

සියලුම අයදුම්කරුවන් ආපසු නොගෙවන රු. 500 ක මුදලක් දුම්රිය සාමාන්‍යාධිකාරී නමට මහජන බැංකුවේ ගිණුම් අංක 176100129027313 දරන ගිණුමට බැරකර ලබාගන්නා ලද රිසිට්පත අයදුම්පත සමග අමුණා එවිය යුතුය. වෙනත් ක්‍රම වලින් විභාග ගාස්තු ගෙවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත. අසම්පූර්ණ හෝ අවිධිමත් අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් තමන්ගේ අනන්‍යතාවය විභාග මධ්‍යස්ථානයේදී තහවුරු කළ යුතු ය.

11. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*
යතුරු ලියන කඩදාසි ප්‍රමාණයේ (ඒ -4) අයදුම්කරුවා විසින්ම අයදුම්පත සකස්කරගත යුතු අතර, අයදුම්පත බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස උඩ කෙලවරේ ''උප දුම්රිය ස්ථානාධිපති විභාග අයදුම්පත්‍රය'' යනුවෙන් සඳහන් කර දුම්රිය සාමාන්‍යාධිකාරී, තැ. පෙ. 355, දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, කොළඹ 10 යන ලිපිනයට 2021.04.27 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (ආදර්ශ අයදුම්පත්‍රය පහත පරිදි වේ.)

12. *අයදුම්පත සහතික කිරීම :*

ඉල්ලුම්පත්‍රයේ ඇති අයදුම්කරුවාගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකරුවෙකු/දිවුරුම් කොමසාරිස් වරයෙකු/නීතිඥවරයෙකු/ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 237,060 කට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කරනු ලැබිය යුතු ය.

13. මෙම නිවේදනයේ සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් ඇත්තේ නම් එවැනි විටකදී සිංහල භාෂාවෙන් වන නිවේදනය නිවැරදි බව සලකා කටයුතු කළ යුතු ය.

එම්. ජේ. ඩී. ප්‍රනාන්දු,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2021 මාර්තු මස 04 වැනි දින,
කොළඹ 10,
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී ය.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

**කොන්ත්‍රාත් පදනම මත උප දුම්රිය ස්ථානාධිපති තනතුරට ඉල්ලුම් කිරීම සඳහා වූ අයදුම්පත**

අයදුම්කරන උප දුම්රිය ස්ථාන - (සිංහලෙන්/දෙමළෙන්)
පළමු මනාපය :————.
දෙවන මනාපය :————.
තෙවන මනාපය :————.

අයදුම්කරන උප දුම්රිය ස්ථාන - (ඉංග්‍රීසියෙන්)
පළමු මනාපය :————.
දෙවන මනාපය :————.
තෙවන මනාපය :————.

01. (i) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :————.
(iii) මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
(iv) මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :————.

02. ස්ථිර ලිපිනය :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.
(iii) දුරකථන අංකය (නිවස) :————. (ජංගම) :————.

03. (i) උපන් දිනය : ☐☐☐☐☐☐☐☐

2021.04.27 දිනට (අයදුම්පත් කැඳවන අවසන් දිනට) වයස :

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

(ii) උස :————.
(iii) පපුව :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐

05. දිස්ත්‍රික්කය : (සිංහලෙන්/දෙමළෙන්) ☐ ඉංග්‍රීසියෙන් : ☐

06. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :
(සිංහලෙන්/දෙමළෙන්) ☐
(ඉංග්‍රීසියෙන්) ☐

ග්‍රාම නිලධාරි කොට්ඨාසය :
(සිංහලෙන්/දෙමළෙන්) ☐
ඉංග්‍රීසියෙන් ☐

07. ඔබගේ ස්ථිර පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරන උප දුම්රිය ස්ථානයට ඇති දුර ප්‍රමාණය :

(ඍජු දුර) කි. මී. වලින් දක්වන්න. :

| *උප දුම්රිය ස්ථානය* | *දුර ප්‍රමාණය (කි. මී.)* |
|---|---|
| | |
| | |
| | |

08. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා./පෙළ)

| *වර්ෂය හා විභාග අංකය* | *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

09. වෙනත් සුදුසුකම් :————.

10. ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : (සිංහල/දෙමළ)

11. ඔබ කිසියම් චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේනම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. :————.

12. ............... දින මහජන බැංකුවේ ............... ශාඛාවට රු. 500 ක් ගෙවා ලබාගත් මුදල් බැරපතෙහි මුල් පිටපත මේ සමඟ අමුණා එවමි.

(වෙනත් ක්‍රමවලින් විභාග ගාස්තු ගෙවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත.)

13. අයදුම්කරුගේ සහතිකය :

(*අ*) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.
(*ආ*) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය හා වැරදි සහගත බව මා පත් කරනු ලැබීමට පෙර සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවටත් පත්වීම් ලැබීමෙන් පසුව අනාවරණය වුවහොත් මගේ සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන, ජාතික හැඳුනුම්පත් අංක ......... දරන ........................... මහතා මා පෞද්ගලිකව දන්නා බවත් ඔහු අද දින මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

03-708

## ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ සැලසුම් ශිල්පී - පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

1.0 ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුරු පුරප්පාඩු 06ක් පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ගොඩනැගිලි අධ්‍යක්‍ෂ ජනරාල් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව ඒ 4 කඩදසියේ දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කරන ලද අයදුම් පත්‍රයක් 2021.04.26 වැනි දිනට හෝ එදිනට ප්‍රථම ''ගොඩනැගිලි අධ්‍යක්‍ෂ ජනරාල්, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, 2 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ''ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ සැලසුම් ශිල්පී පුහුණු කිරීමේ ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය'' යනුවෙන් අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

3.0 *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

3.1 මෙම තනතුර ස්ථිර ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. (කරුණාකර 6.1 යටතේ ඇති සටහන බලන්න.)

3.2 පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා බඳවා ගන්නා නියමිත වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන්, සේවයට අදළ විෂය නිර්දේශය අනුව ලබා ගන්නා එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදළ විභාගය සමත් වීමෙන් පසු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

3.3 රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්ති ද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති ද අදල වේ.

3.4 තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තු නියෝග වලට ද, කලින් කල රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද යටත් විය යුතු ය.

4.0 *සාමාන්‍ය සුදුසුකම් :*

4.1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

4.2 විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

4.3 බඳවා ගන්නා නිලධාරින් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට එකඟ විය යුතු ය.

4.4 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 30ට නොවැඩි විය යුතු ය. දැනටමත් රජයේ සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා වයස් සීමාව අදල නොවේ.

5.0 *අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :*

5.1 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.;

සහ

5.2 ක්ෂේත්‍රයට අදළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම.

6.0 *වෘත්තීය සුදුසුකම් :*

6.1 ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ සැලසුම් ශිල්පී - පුහුණු කිරීමේ ශ්‍රේණිය
ඉහත 5.0 හි අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ක්‍ෂේත්‍රයට අදල පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් සම්පූර්ණ කර ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනය වන විට අදල සහතිකය ලබා තිබීම.

I. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම;

හෝ

II. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක

සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම;

හෝ

III. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම;

හෝ

IV. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**සටහන :** ඉහත 5.0 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් හා 6.1 හි සඳහන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී - පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා අදාළ නියමිත වෘත්තීය සුදුසුකම් සහිත තෝරා පත්වන අයදුම්කරුවන්, සේවයට අදාළ විෂය නිර්දේශය අනුව ලබා ගන්නා එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාළ විභාගය සමත් වීමෙන් පසු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

7.0 *තෝරාගැනීමේ පදනම :*

7.1 ලිඛිත තරග විභාගයේ කොන්දේසි :

මේ සඳහා වන ලිඛිත විභාගය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනුවෙන් ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින් කොළඹ දී පවත්වනු ලබන අතර, ඒ අනුව අදාළ ආයතනය දනුම් දෙනු ලබන දිනක දී විභාගය පැවැත්වෙනු ඇත. ඒ අනුව පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතු වේ.

7.2 සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත තරග විභාගයකට යොමු කරන අතර, සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු ය. එම විභාගයේ ලකුණු ලබාගත් අනු පිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් එම ලකුණු අනුපිළිවෙල අනුව තෝරාගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු නොලබන අතර, සුදුසුකම් පමණක් පරික්ෂා කරනු ලැබේ.

7.3 ලිඛිත තරග විභාගයට අදාළ විස්තර පහත පරිදි වේ :-

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | පැය 1 කි | 100 | 40 |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 3කි. | 100 | 40 |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | අවබෝධ කර ගැනීමේ ශක්තිය, තර්කානුකූල විචාර බුද්ධිය, නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටළු විසඳීමේ හැකියාව, භාෂා ඛණ්ඩ, වගු, පින්තූර, සටහන්, ප්‍රස්ථාර භාවිතය |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | සුදුසු පරිමාණයකට අනුව ගොඩනැගිලි සැලසුම් ඇඳීම හා සටහන් පිළියෙල කිරීමේ හැකියාව |

7.4 ලිඛිත තරග විභාගය සිංහල/දෙමළ භාෂාවෙන් පමණක් පවත්වනු ලැබේ.

8.0 *බඳවා ගැනීම :*

ඉහත 5.0 සහ 6.0 යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා ඇති ලිඛිත විභාගය සමත්, ඉහත පුරප්පාඩු ප්‍රමාණය මත ලකුණු ලබා ගන්නා අනුපිළිවෙල අනුව සුදුසුකම්ලත් අයදුම්කරුවන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

9.0 *වැටුප් පරිමාණය :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016හි MN-3-2016 යටතේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී III ශ්‍රේණිය

රු. 31,040-10x445-11x660-10x730-10x750-රු. 57,550 (වැටුප් ගෙවනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන II අනුව ය.)

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී - පුහුණු කිරීමේ ශ්‍රේණිය

මාසික දීමනාව රු. 27,140 (වැටුප් ගෙවනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන V අනුවය)

10.0 *විභාග ගාස්තු* :

විභාග ගාස්තුව රු. 1,000 කි. අයදුම්කරුවන් විසින් ආපසු නොගෙවනු ලබන රු. 1,000 ක විභාග ගාස්තුවක් දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකුවක් මගින් ''ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ බත්තරමුල්ල ලංකා බැංකුවේ අංක 7042710 දරන ගිණුම'' වෙත ගෙවිය යුතු අතර, ලදුපතේ මුල් පිටපත අයදුම්පතේ අංක 12 යටතේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

11.0 යම් අයදුම්කරුවෙකුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමෙන්, තෝරාගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

12.0 *අත්සන සහතික කිරීම* :

අයදුම්කරුවන් තම ආදර්ශ අත්සන, රජයේ පාසල් ප්‍රධානියකු/විශ්‍රාමික ප්‍රධානියකු කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු. 5,71,380 හෝ ඊට වැඩි හෝ වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරයක විහාරාධිපති, නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය තත්ත්වයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයන් සිය අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

13.0 මෙම නිවේදනයෙන් ආවරණය නොවන කරුණක් සඳහා අවසන් තීරණ ගැනීමේ බලය ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එසේම සිංහල/දෙමළ පරිවර්තනයන් අතර යම් අනනුකූලතාවයක් මතු වුවහොත් සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත් වේ.

ඉංජි. එම්. එච්. එම්.ඉස්මයිල්,
ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්.

2021 මාර්තු මස 02 වැනි දින,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී - (පුහුණු කිරීමේ ශ්‍රේණිය)**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ලිඛිත තරග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - S
දෙමළ - T

(අදාළ ඉංග්‍රීසි අකුර කොටුව තුළ ලියන්න.)

01. (i) සම්පූර්ණ නම :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

(iii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.) :————.

02. ලිපිනය හා දුරකථන අංක :————.
(i) කාර්යාලයීය ලිපිනය :————.
දුරකථන අංකය :————.

(ii) පෞද්ගලික ලිපිනය :————.

(iii) දුරකථන අංකය :————. (iv) ජංගම දුරකථන අංකය :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :

පුරුෂ - 0

ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. (i) උපන් දිනය : වර්ෂය මාසය දිනය

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු මාස දින

06. විවාහක/අවිවාහක බව :

අවිවාහක - 1

විවාහක - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර (පළමුවර) (කරුණාකර පිටපත් අමුණන්න.)

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය :————.

(ii) අයදුම්කරුගේ විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| .................. | ...... | .................. | ...... |
| .................. | ...... | .................. | ...... |
| .................. | ...... | .................. | ...... |
| .................. | ...... | .................. | ...... |
| .................. | ...... | .................. | ...... |

08. අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර (දෙවැනි වර) අවශ්‍ය නම් පමණක් (කරුණාකර පිටපත් අමුණන්න.) :

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය :————.

(ii) අයදුම්කරුගේ විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| .................. | ...... | .................. | ...... |
| .................. | ...... | .................. | ...... |
| .................. | ...... | .................. | ...... |
| .................. | ...... | .................. | ...... |
| .................. | ...... | .................. | ...... |

09. අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න.)
(i) විභාගය සමත් වූ වර්ෂය :————. මාසය :————. දිනය :————.
(ii) අයදුම්කරුගේ විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| .................. | ...... | .................. | ...... |
| .................. | ...... | .................. | ...... |
| .................. | ...... | .................. | |

10. අනෙකුත් සුදුසුකම් : තාක්‍ෂණ/වෘත්තීය (කරුණාකර පිටපත් අමුණන්න.)

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

11. අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති පළපුරුද්ද ? (කරුණාකර පිටපත් අමුණන්න.)
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

ඉහත 10, 11 සඳහා සුදුසුකම් සනාථ කරන සහතිකවල පිටපත් ඇමුණුම් ලෙස ඉදිරිපත් කිරීම අනිවාර්ය බව සලකන්න.

12. විභාග ගාස්තු :

මුදල් ගෙවූ රිසිට්පත් අංකය : | | | | | | | | | | | | | | | |

රු. 1,000ක් වන විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.
රිසිට්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

13. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ........................................................................ (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, .................. දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මෙයින් සහතික කරමි.

දිනය :————.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

14. *අයදුම්කරුගේ ප්‍රකාශය* :

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මම මෙයින් සහතික කරමි. තව ද, මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හා සාවද්‍ය බව සොයා ගතහොත් එම සොයා ගැනීම තෝරාගැනීමට පෙර සිදුවුවහොත් මා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසුව සොයා ගනු ලැබුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට ලක්වන බව ද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණි

මෙම ඉල්ලුම්කරු වන................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ......................... වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක ලෙස සේවය කරන බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

03-720

---

**රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019/(2021)

**(කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව)**

අංක 1930/12 හා 2015.09.01 දිනැති රජයේ *අතිවිශෙෂ ගැසට්* නිවේදනය මගින් ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුකූලව යථෝක්ත පාඨමාලාව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් 2021 මැයි මස සිට සතිඅන්ත පාඨමාලාවක් ලෙස සති 15ක් පුරා සෙනසුරාදා දිනයන් හි පැවැත්වීම ආරම්භ කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම පාඨමාලාව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ දී ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, පාඨමාලාව අවසානයේ දී එක් එක් විෂයය සඳහා අවසන් පරීක්ෂණයක් පැවැත්වේ. එහි ප්‍රතිඵල මත පාඨමාලාව සමත්වීම තීරණය කරනු ලබන අතර සමත් වූ අයදුම්කරුවන් ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළා සේ සැළකේ. පාඨමාලාවට නිලධරයන් තෝරා ගැනීම, පාඨමාලාව පැවැත්වීම, විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම, පාඨමාලා සහතික නිකුත් කිරීම හා පාඨමාලාව සඳහා සහන කාල ලබාදීම සම්බන්ධයෙන් එම පීඨයේ පීඨාධිපති විසින් නියම කරන ලද නීතිරීතිවලට පාඨමාලා අපේක්ෂකයින් යටත් වේ. විශ්වවිද්‍යාලය විසින් පනවනු ලබන නීතිරීති උල්ලංඝනය කළහොත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට හා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්වීමට ඔවුනට සිදුවෙනු ඇත.

(ii) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පාඨමාලාව ආරම්භයේ දී අදාළ නීතිරීති හා පාඨමාලාව සම්බන්ධයෙන් ඔබව දැනුම්වත් කරනු ඇත.

03. මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමේ ආදර්ශ අයදුම්පත මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. එම ආදර්ශ අයදුම්පත අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත් පිළියෙල කර ගත යුතු අතර, ඒ අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මධ්‍යම රජයේ නිලධරයෙකු නම් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකු නම් ඔවුන් සේවය කරන පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් ද, 2021

අප්‍රේල් මස 27 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනය වෙත තම අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019(2021)'' ලෙස සඳහන් විය යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් කිසිදු පරීක්ෂණයකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට පීඨාධිපති වෙත බලය පිරිනමනු ලැබේ.

04. *අනන්‍යතාව* :

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති සෑහීමකට පත් වන ලෙස තම අනන්‍යතාව අපේක්ෂකයින් විසින් සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පාඨමාලා ආරම්භයේ දී හා පාඨමාලා කාලය තුළ අවශ්‍යතාවය මත ඉදිරිපත් කිරීමට අපේක්ෂකයන් විසින් ළඟ තබා ගත යුතුය.

(*අ*) ජාතික හැඳුනුම්පත.

(*ආ*) තම ආයතනය විසින් නිකුත් කරන ලද රාජකාරි හැඳුනුම්පත;

හෝ

තම ආයතනය විසින් නිකුත් කරන ලද අනන්‍යතාවය තහවුරු කල හැකි ලේඛනය.

05. *අයදුම්පත්‍රය* :

(i) ''ඒ 4'' ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් පිළියෙල කළ යුතුය. අයදුම්පත යතුරු ලියනය කර පිළියෙල කරගත හැකි වුවද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින් පිරවිය යුතු අතර විශේෂයෙන්ම සඳහන් කර ඇති අවස්ථාවල දී පමණක් විශේෂයෙන් සඳහන් කර ඇති භාෂාවෙන් අයදුම්පත පිරවිය යුතුය. අයදුම්පතේ සඳහන් පරිදි නිලධරයන්ගේ නම පාඨමාලාවේ සියලු අවස්ථාවල දී භාවිතා කරන බැවින් ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය. යම් හෙයකින් එම තොරතුරු පාඨමාලා කාලය තුළ වෙනස් වුවහොත් ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ලිඛිතව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ, පීඨාධිපති වෙත දැනුම් දිය යුතුය.

(ii) අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල මාධ්‍ය අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ මාධ්‍ය අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එම අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අයදුම්කරුගේ මෑතක දී ලබාගත් තැපැල් මුද්දරයක ප්‍රමාණයේ වර්ණ ඡායා රූපයක පිටපත් 2ක් ඉදිරිපත් කළ යුතුය. ඉන් එක් පිටපතක් අයදුම්පතේ මුල් පිටුවෙහි දකුණත් පස ඉහළ කෙළවරේ සපයා ඇති කොටුව තුළ ඇලවිය යුතු වන අතර, අනෙක් පිටපත අයදුම්පත සමග අමුණා තිබිය යුතුය.

06. *පාඨමාලා ගාස්තු හා විභාග ගාස්තු* :

(i) මෙම පාඨමාලාව සඳහා පෙනී සිටින නිලධරයන් විසින් රු. 17,500.00ක මුදලක් මහජන බැංකුව ගංගොඩවිල ශාඛාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ, පීඨ සංවර්ධන අරමුදල් ජංගම ගිණුම් අංක 097100140002229 වෙත බැර කළ යුතුය. අයදුම්කරු සේවයේ නියුක්ත ආයතනය මගින් එවනු ලබන චෙක්පතකින් හෝ බැංකු අණකරයකින්, අදාළ අයදුම්කරු විසින් මුදල් තැන්පත් කර, ලබාගත් රිසට්පත ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ, පීඨාධිපති වෙත පාඨමාලා සමායෝජක විසින් දැනුම් දෙනු ලබන දිනට පෙර ඉදිරිපත් කල යුතුය. මෙම ගාස්තුව සඳහා ආයතනික ගාස්තු, මුද්‍රණ ගාස්තු, විභාග ගාස්තු, සම්පත්දායක දීමනා, සම්බන්ධීකරණ ගාස්තු ඇතුළත් වේ.

(ii) එසේ වුවත් මුල් අවස්ථාවේ දී පාඨමාලාවට අදාළ විභාග සමත්වීමට අපොහොසත් වුවහොත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විභාගයට පෙනී සිටින්නේ නම් රු. 1,000 ක විභාග සඳහා ලියාපදිංචි ගාස්තුවක් ද, රු. 2000 ක විභාග ගාස්තුවක් ද, ගෙවිය යුතුය. එම ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ, පීඨාධිපතිගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

(iii) කවර හේතුවක් යටතේ වුවද මෙම පාඨමාලාව සඳහා අයකරන කිසිදු ගාස්තුවක් ආපසු ගෙවනු

නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් හෝ පාඨමාලාවක් හෝ නිලධරයකු සඳහා මාරු කිරීමටද ඉඩදෙනු නොලැබේ.

07. *පාඨමාලාව සඳහා අයදුම් කිරීමේ සුදුසුකම්* :

(i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර සියලු නිලධරයන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන තෙවන වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(ii) I වන ශ්‍රේණියේ නිලධරයන්ට අමතරව දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් නිලධරයන්ටද තෙවන කාර්යක්ෂමතා කඩඉම සඳහා නියමිත පාඨමාලාව සම්පූර්ණ කළ හැක.

**සටහන** : දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඒ ඒ නිලධරයාගේ ජ්‍යෙෂ්ඨතාවය හා ඉහත 07.i, 07.ii ඡේදවල කරුණු සම්බන්ධයෙන් තම අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

08. *පාඨමාලාව සඳහා තෝරාගැනීම* :

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වූ නිලධරයන්ගේ එම ශ්‍රේණියට පත් ජ්‍යෙෂ්ඨතාවයේ අනුපිළිවෙල අනුව පාඨමාලාව සඳහා නිලධරයන් තෝරා ගැනීමේදී ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

09. අයදුම්පත් එවා ඇති සියලුම නිලධරයන්ගේ විස්තර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති පවත්වාගෙන යනු ලබන දත්ත පද්ධතියට ඇතුළත් කරන අතර එක් වසරකට නිලධාරීන් 400කින් යුත් එක් කණ්ඩායමක් පමණක් මෙම පාඨමාලාවට සහභාගී කරවා ගනු ලබයි. පාඨමාලාව සඳහා සහභාගිවීමට තෝරාගත් අයදුම්කරුවන්ගේ නාම ලේඛනය රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය මගින් ප්‍රසිද්ධ කරනු ලබන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් තෝරා ගනු ලබන නිලධරයන් වෙත ඒ බව දන්වනු ලැබේ. **එසේ දැනුම් දීමෙන් පසු සහභාගි නොවන අයදුම්කරුවන් වෙත විශ්ව විද්‍යාලය මගින් නැවත දැනුම් දීමට බැඳී නොසිටින අතර, එය නිලධරයාට හිමි වූ එක් අවස්ථාවක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ.**

10. පාඨමාලාවේ විෂය නිර්දේශය :

| අනු අංකය | විෂය නිර්දේශය | ක්‍රෙඩිට් ගණන | ක්‍රෙඩිට් පැය |
|---|---|---|---|
| 01. | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 02 | 30 |
| 02. | මානව සම්පත් කළමනාකරණය (මූලික සිද්ධාන්ත) | 02 | 30 |
| 03. | ගැටුම් කළමනාකරණ (සංවිධානයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමේදී ගැටුම් කළමනාකරණ සිද්ධාන්තවල ප්‍රායෝගික භාවිතය) | 02 | 30 |
| 04. | සංවිධාන චර්යාව | 02 | 30 |
| 05. | ව්‍යාපෘති වාර්තාව තමන්ගේ වෘත්තිය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මතු වන ගැටලුවක් හෝ වෘත්තීය ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණාත්මක නිබන්ධනයක් | 02 | 30 |
| | | 10 | 150 |

11. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

12. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය නිරවද්‍ය ලෙස බල පැවැත්වෙන්නේ ය.

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය.

2021 මාර්තු මස 10 වැනි දින,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

(*ගැසට්* නිවේදනය හා ආදර්ශ අයදුම්පත්‍රය www.pubad.gov.lk වෙතින් භාගත කරගත හැක.)

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| තැපැල් මුද්දරයක ප්‍රමාණයේ ඡායා රූපයක් මෙහි අලවන්න. |

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019 (2021)**
**(කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව)**
Third Efficiency Bar Examination for the Officers in Grade I of Sri Lanka Technological Service - 2019(2021)
(Three Months Certificate Course on Management)

01. (අ) මුල්’කුරු අගට යොදා මුල්’කුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා. : GUNAWARDHANA, M. G. B. S. K.
(ආ) සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ඇ) මුල්’කුරු සමග නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. ඔබ අයත් වන්නේ පළාත් රාජ්‍ය සේවයට ද, එසේ නොමැති නම් කුමන රාජ්‍ය සේවයටද යන වග අදළ අංකය කොටුව තුළ ලියන්න.

| |
|---|
| |

(මධ්‍යම රජයේ සේවය - 10/බස්නාහිර පළාත් රාජ්‍ය සේවය - 01/මධ්‍යම පළාත් රාජ්‍ය සේවය - 02/දකුණු පළාත් රාජ්‍ය සේවය - 03/උතුරු පළාත් රාජ්‍ය සේවය - 04 /නැගෙනහිර පළාත් රාජ්‍ය සේවය 05/වයඹ පළාත් රාජ්‍ය සේවය -06/උතුරුමැද පළාත් රාජ්‍ය සේවය - 07/ඌව පළාත් රාජ්‍ය සේවය - 08/සබරගමුව පළාත් රාජ්‍ය සේවය - 09)

03. තනතුරු නාමය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

04. ඔබ අයත්වන උප දෙපාර්තමේන්තුව/අංශය :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

05. ඔබ අයත්වන දෙපාර්තමේන්තුව :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

06. රාජකාරි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(සිංහලෙන්/දෙමළෙන්)

07. (i) පෞද්ගලික ලිපිනය :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

(ii) පදිංචි දිස්ත්‍රික්කය :————.

08. විද්‍යුත් තැපැල :————.

09. දුරකථන අංකය :

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පෞද්ගලික | | | | | | | | | | |
| රාජකාරි | | | | | | | | | | |

10. ස්ත්‍රී/පුරුෂ භාවය ෑ
පුරුෂ - M
ස්ත්‍රී - F (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

11. (i) ජාතික හැඳුනුම්පත් අංකය ෑ [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

(තමන් විසින් සත්‍ය පිටපතක් බවට අනු අත්සන් කළ ජාතික හැඳුනුම්පතේ පිටපතක් අමුණන්න.)

(ii) උපන් දිනය ෑ වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

12. (අ) ඔබ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයෙකු නම් ෑ

(i) I ශ්‍රේණියට උසස් වූ දිනය ෑ වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

(ii) 2021.04.27 දිනට I ශ්‍රේණියේ සක්‍රීය සේවා කාලය ෑ අවු. [ ] මාස [ ] දින [ ]

(තමන් විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද I ශ්‍රේණියට උසස්වීම් ලැබූ ලිපියේ පිටපත ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරන්න.)

(ආ) ඔබ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ශ්‍රේණියේ නිලධරයෙකු නම් ෑ

(i) II ශ්‍රේණියට උසස් වූ දිනය ෑ

වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

(ii) 2021.04.27 දිනට II ශ්‍රේණියේ සක්‍රීය සේවා කාලය ෑ අවු. [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

(iii) දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය ෑ

වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

(තමන් විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිලධරයා වෙත නිකුත් කරන ලද දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ ප්‍රතිඵල ලේඛනයේ පිටපත ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරන්න.)

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, තව ද පාඨමාලාව පැවැත්වීම, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති විසින් පනවනු ලබන නීතිරීති වලට හා ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට යටත්වන බව ද ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල වන පරිදි අයදුම්පත සකසා ඇති බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන .............................. මහතා/මහත්මිය/මෙනෙවිය .................. දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධරයාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත අංක 01 සිට 12 තෙක් අඩංගු තොරතුරු නිවැරදි බවත්, අයදුම්පත් කැඳවීම් නිවේදනයේ 07 ඡේදයේ සටහනට අනුව හා 08, 09 ඡේදවල විධිවිධානවලට යටත්ව මෙම අපේක්ෂකයා මෙම පාඨමාලාවට සහභාගී වීමට සුදුසුකම් සහිත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධරයකු බවත්, නියමිත පාඨමාලා ගාස්තු ගෙවීමට දෙපාර්තමේන්තුවට හැකියාව පවතින බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

*පිරික්සුම :*

1. තමන් විසින් සත්‍ය පිටපතක් බවට අනු අත්සන් කළ ජාතික හැඳුනුම්පතේ පිටපතක් අමුණා ඇත. ☐
2. තැපැල් මුද්දරයක ප්‍රමාණයේ ඡායා රූපයක් අයදුම්පත ඉහළ දකුණත් කෙළවරේ අලවා ඇත. ☐
3. තැපැල් මුද්දරයක ප්‍රමාණයේ ඡායා රූපයක් අයදුම්පත සමග අමුණා ඇත. ☐
4. තමන් විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද I ශ්‍රේණියට උසස්වීම් ලැබූ ලිපියේ පිටපත අමුණා ඇත. ☐

හෝ

තමන් විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිලධරයා වෙත නිකුත් කරන ලද දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ ප්‍රතිඵල ලේඛනයේ පිටපත අමුණා ඇත.

03-724

---

**ජාතික උරුම ප්‍රාසංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

ටවර් හෝල් රඟහල පදනම

**ටවර් නාට්‍ය හා රංග කලා පාසලේ නාට්‍ය හා රංග කලාව පූර්ණ කාලීන (දෙවර්ෂ) උසස් ඩිප්ලෝමා පාඨමාලාවට 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමේ තරග විභාගය - 2021**

ටවර් නාට්‍ය හා රංග කලා පාසලේ නාට්‍ය හා රංග කලාව පූර්ණ කාලීන (දෙවර්ෂ) උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා 2021/2022 අධ්‍යයන වර්ෂයට ටවර් නාට්‍ය හා රංගකලා පාසලට සිසුන් ඇතුළත් කිරීමේ තරග විභාගය - 2021 සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තරග විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිංහල මාධ්‍යයෙන් 2021 ජූලි මස තුළ ප්‍රධාන නගර කිහිපයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයන්හි පවත්වනු ලැබේ.

2.0 *නාට්‍ය හා රංග කලාව (දෙවර්ෂ පූර්ණ කාලීන) උසස් ඩිප්ලෝමාව :*

2.1 1978 අංක 1 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපිත, යුනෙස්කෝවට අනුබද්ධ ජාත්‍යන්තර රංගකලා ආයතනයේ (ITI) නිත්‍ය නියෝජිත ටවර් හෝල් රඟහල පදනම යටතේ පාලනය වන ටවර් නාට්‍ය හා රංග කලා පාසල විසින් නාට්‍ය හා රංගකලාව පූර්ණකාලීන (දෙවර්ෂ) උසස් ඩිප්ලෝමා පාඨමාලාව පවත්වාගෙන යනු ලැබේ. පාඨමාලා කාලය වසර 02කි. මෙම පාඨමාලාව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි (SLQF) 03 වන හා 04 වන මට්ටම ආවරණය කරනු ලබන අතර එසේ (SLQF) 04 මට්ටම අදාළ නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමාව ලබා දේ.

2.2 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමකින් ඇති කර ගත් එකගතාව මත මෙම පාඨමාලාව ක්‍රියාත්මක වන අතර නාට්‍ය හා රංගකලාව (දෙවර්ෂ පූර්ණ කාලීන) උසස් ඩිප්ලෝමාව ලබා ගන්නා සිසුන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ ද්විතීයික හා තෘතියික අධ්‍යාපන අධ්‍යයනාංශය මෙහෙයවන අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි පාඨමාලාවේ අවසන් වර්ෂ 02 (SLQF) - 5 හා (SLQF) - 6 සඳහා යොමු කෙරේ. මෙම උපාධි වැඩසටහන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

2.3 මෙම පාඨමාලාව ගැහැණු පිරිමි දෙපක්ෂයටම විවෘත අතර මෙම බඳවා ගැනීමේ තරග විභාගයෙන් සුදුසුකම් ලැබූ අය ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව කුසලතා පදනම මත ටවර් නාට්‍ය හා රංගකලා පාසලට තෝරා ගනු ලැබේ.

2.4 මෙම ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණය නාට්‍ය හා රංගකලා විෂයට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකි.

2.5 මෙම පාඨමාලාව සිංහල මාධ්‍යයෙන් පැවැත්වේ.

2.6 මෙම පාඨමාලාව සඳහා අනේවාසික පදනම යටතේ සිසුන් ඇතුළත් කරනු ලැබේ.

03. *පාඨමාලාවට ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් :*

3.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ. පො. ස (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06කින් සමත් වී තිබිය යුතු අතර ඕනෑම වාර ගණනකදී සිංහල/ ගණිතය/සෞන්දර්යය යන විෂයන් තුන(03) සහ තවත් එක් විෂයකට අනිවාර්යයෙන් සම්මාන හෝ ඊට ඉහළ සාමර්ථ්‍යයක් තිබිය යුතුය. එමෙන්ම දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි විෂය සමත්ව තිබිය යුතුය.

සහ

අ. පො. ස (උ. පෙළ) විභාගයේදී දෙවාරයකට නොවැඩි වාර ගණනකදී ඕනෑම විෂය ධාරාවකින් විෂයන් තුන එකවර සමත්ව තිබීම.

(ආ) මෙම පාඨමාලාවට සිසුන් තෝරා ගැනීමේදී නාට්‍ය හා රංගකලාව විෂයක් ලෙස අ. පො. ස (උ. පෙළ) සඳහා හදාරා ඇති සිසුන්ට ප්‍රමුඛතාව ලබා දීම සඳහා සලකා බැලේ.

3.2 2021.04.27 වන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 17ට නොඅඩු සහ අවුරුදු 23ට නොවැඩි විය යුතු අතර අවිවාහක විය යුතුය.

3.3 මෙම පාඨමාලාව නාට්‍ය හා රංගකලා කටයුතුවලට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් පාඨමාලාවක් බැවින් මේ සඳහා ඔබ තෝරා ගතහොත් මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බවට රජයේ වෛද්‍යවරයකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

3.4 පූජ්‍ය පක්ෂය හා රජයේ සේවයේ නියුතු අය මෙම තරග විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් නොලබයි.

04. *පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම :*

4.1 පාඨමාලාව සඳහා අයදුම්පත් නිකුත් කිරීම සිදුකරනු ලබන්නේ මාර්ගගත ක්‍රමයට (online) පමණි. www. towerhall.lk වෙබ් අඩවියට පිවිස අයදුම්පත බාගත කර ගත හැකිය.

4.2 විභාග ගාස්තුව රුපියල් 1, 500/- කි. අයදුම්කරු විසින් ලංකා බැංකුවේ හයිඩ් පාර්ක් ශාඛාවේ 2327541 ගිණුම් අංකය වෙත ටවර් හෝල් රඟහල පදනම නමින් ඉහත මුදල බැර කළ යුතුය. මුදල් බැර කර තැන්පත්කරු ලෙස අයදුම්කරු ලබා ගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස අලවා එවීමට කටයුතු කළ යුතු වේ.විභාග ගාස්තු සඳහා වූ මුදල් ගෙවා ලබා ගත් ලදුපත අයදුම්පත සමග ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු නොකෙරේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් තමා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

4.3 සියලු අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් පමණක් 2021-04.27 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ ජනරාල්,ටවර් හෝල් රඟහල පදනම,123,විජේරාම මාවත,කොළඹ 07 ලිපිනයට එවිය යුතුය.ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.තැපෑලේදී ප්‍රමාද වන හෝ නැති වන හෝ අයදුම්පත් පිළිබඳ ටවර් හෝල් රඟහල පදනම විසින් වගකීම් දරනු නොලැබේ.

4.4 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවර "2021-2022 ටවර් නාට්‍ය පාසලට ඇතුළත් වීම" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

05 *විභාග මධ්‍යස්ථාන හා විභාගය පැවැත්වෙන මාධ්‍යය :*
මෙම විභාගය පහත සඳහන් නගරවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පවත්වනු ලැබේ.

| *නගර අංකය* | *නගරය* |
|---|---|
| 1 | අනුරාධපුරය |
| 2 | බදුල්ල |
| 4 | කොළඹ |
| 7 | මහනුවර |
| 9 | මාතර |
| 12 | රත්නපුර |

කිසියම් විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් විභාග අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති විට ඔවුන්ගේ දෙවැනි කැමැත්ත අනුව හෝ අයදුම්කොට ඇති මධ්‍යස්ථානයට සමීප වෙනත් විභාග මධ්‍යස්ථානයක් හෝ ඔවුන්ට නියම කෙරෙනු ඇත. විභාගය සඳහා ඉල්ලුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. තවද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ

විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹදී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

06 විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

1. ජාතික හැඳුනුම්පත
11. වලංගු විදේශ ගමන් බලපත්‍රය
111. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

07 විභාග ක්‍රමය :

7.1 තරග විභාගය සඳහා වූ විෂයන් හා කාලසටහන පහත සඳහන් වේ :-

| විෂයය | කාලය | ලකුණු |
|---|---|---|
| පළමු ප්‍රශ්න පත්‍රය (01) සිංහල භාෂාව සහ අවබෝධය | පැය 02යි | 100 |
| දෙවන ප්‍රශ්න පත්‍රය (02) සාමාන්‍ය දැනීම | පැය 01යි | 100 |

ඉහත විෂයන් සඳහා විෂය නිර්දේශය පහත පරිදි වේ. එක් එක් විෂය සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය 25% ක් වේ.

01 සිංහල භාෂාව සහ අවබෝධය :
අ.පො.ස (සා. පෙළ) සිංහල විෂය නිර්දේශ මට්ටම හා සිංහල භාෂාව පිළිබඳ පොදු විෂය කරුණු ආශ්‍රිතව සකස් කළ බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න මෙන්ම අවබෝධය හා අක්ෂර වින්‍යාසය,ව්‍යාකරණ මෙන්ම රචනාමය ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

02 සාමාන්‍ය දැනීම :

නාට්‍ය හා රංග කලාව විෂය පිළිබඳ සාමාන්‍ය දැනීමේ ප්‍රශ්න හා පොදුවේ ලෝකයේ හා ශ්‍රී ලංකාව පිළිබඳ සමාජ, ආර්ථික, දේශපාලනික සංස්කෘතිමය,විද්‍යා, ක්‍රීඩා හා ඉතිහාසය පිළිබඳ බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්තය.

